සැ. යු. - (i) 2014.05.23 වැනි දින පළ වූ අංක 1864 දරන ගැසට් පත්‍රයේ I : III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,865 - 2014 මැයි මස 30 වැනි සිකුරාදා - 2014.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 714 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 720 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 733 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - රංජිත් සියඹලාපිටිය මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 මැයි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජුනි මස 20 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජුනි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අසම්පූර්ණ කර "ලේකම්, කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2014.06.14 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු II "ආ" | 06 | PL3-2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුයි. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුයි)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>පෞද්ගලික/කුළී රථ සහ තාර බර හොණ්ඩර විසි හතරකට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතික ලබා තිබිය යුතු ය.)<br><br>වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>*වෙනත් සුදුසුකම් :*<br><br>අවම උස අඩි 5 කට වැඩි විය යුතු ය.<br>දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>පවත්වනු ලබන ලිඛිත, ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ. |
| 02. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 05 | PL1-2006A රු. 11,730- 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු.17,600, (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුයි. |
| 03. | සෞඛ්‍ය කම්කරු | 06 | PL1-2006A රු. 11,730- 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු.17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
(2) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(3) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බලනොපානු ඇත.)
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.
(5) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා ලිඛිත පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
(2) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය.

(1) උප්පැන්න සහතිකය;
(2) අධ්‍යාපන සහතික;
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(4) මෑතක දී ලබා ගත් ග්‍රාම සේවා සහතිකය;
(5) මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්;
(6) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

04. *අයදුම් කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2014.06.14 වැනි දිනට පෙර "ලේකම්, කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.
(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතු ය.
(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***සැළකිය යුතුයි.***-මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්. ඩී. ප්‍රැන්සිස්කා,
ලේකම්,
කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 13 වැනි දින,
ගොතටුව නව නගරය,
කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ.... ........................................ තනතුර සඳහා බඳවා ගැනීම*

(1) (අ) මුලකුරු සමග නම :——————————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
(3) ස්ථිර ලිපිනය :——————————.
(4) (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?:——————————.
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද?:——————————.

(5) ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
(6) ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
(7) විවාහක/අවිවාහක තත්ත්වය:——————————.
(8) දුරකථන අංකය:——————————.
(9) උපන් දිනය:——————————.
වර්ෂය:——————————. මාසය:——————————.දිනය:——————————.
(10) 2014.06.14 වැනි දිනට වයස ඃ
අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.
(11) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————————.
(12) වෘත්තීය සුදුසුකම්:——————————.
(13) සේවා පළපුරුද්ද:——————————.
(14) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවකු කරනු ලැබ තිබේ ද?:——————————.
(15) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවරුදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්කරු වන............................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ...................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :——————————.

05-817

---

**මහරගම නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර හා වැටුප් පරිමාණය ඃ

1. විදුලි කාර්මික III
තනතුරු 01
මාසික ඃ රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL-2-2006A)

(i) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ*

*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක්වරක දී සමත්වී තිබිය යුතු ය ;

සහ

(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

(ii) *බාහිර අයදුම්කරුවන් සඳහා :*

(අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරක දී සමත් වී තිබිය යුතුය;

සහ

(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

(iii) *වෘත්තීය සුදුසුකම් :*

(අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම ;

හෝ

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසකරට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

හෝ

(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

2. මෝටර් කාර්මික (මිකැනික්)
තනතුර 01
මාසික : රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL 2-2006A)

එම

3.පැස්සුම්කරු I II
තනතුරු 01
මාසික : රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL2-2006A)
එම

එම

*බඳවා ගැනීමේ ක්‍රමය :*
*ලිඛිත පරීක්ෂණය*

(අ) තනතුරට අදාළව න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා පැය 1 ක බහුවරණ ප්‍රශ්න පත්‍රයක්.

*ප්‍රායෝගික පරීක්ෂණය :*

(ආ) තනතුරට අදාළව පවත්වනු ලබන පැය 1/2 ක ප්‍රායෝගික පරීක්ෂණයක්.

තනතුරට අදාළව තාක්ෂණික දැනුමක් ඇති ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු, පරිපාලනය සම්බන්ධ මාණ්ඩලික නිලධාරියෙකු සහ නගර සභාවේ එක් මාණ්ඩලික නිලධාරියෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ දෙකෙන් ලබා ගන්නා කුසලතාවයන් මත සුදුසසන් බඳවා ගැනේ.

ආදාහනාගාර ක්‍රියාකරු සහායක III
තනතුරු - 8

මාසික : රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145-
12 x 160 - රු. 17,600 (PL1-2006A)

(අ) අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම.

5. මුරකරු II
තනතුරු 1

මාසික : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා.ප.ච. 6/2006) iv හි (PL-1- 2006-A) වැටුප් පරිමාණයේ 12 වන පියවර ආරම්භක වැටුප වේ.)

1. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(අ) අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම.
(ආ) කාර්යාල සේවක සේවයේ III පංතියේ තනතුරක ස්ථිර කර තිබීම සහ වසර 06 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.
(ඇ) III පංතියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම.
(ඈ) පූර්වාසන්න වසර 5 ක කාල සීමාව තුළ සතුටු දායක සේවා කාලයක් තිබීම.

II බාහිර අයදුම්කරුවන් සඳහා

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුය.

6. රියදුරු
තනතුරු 03
මාසික : රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 -
12 x 170 - රු. 18,860 (PL3-2006A)

I. අධ්‍යාපන සුදුසුකම්

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය.)

II වෘත්තීය සුදුසුකම්

(අ) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර් 240 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.

(ආ) වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහිතක මගින් සනාථ කළ යුතුය.)
(ඇ) අවම වශයෙන් උස අඩි 05 ක් විය යුතුය.
(ඈ) දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
(ඉ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

7. (i) වැඩ ක්ෂේත්‍ර කම්කරු (මාර්ග කම්කරුවන් හැර)
තනතුරු 10
මාසික : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600

(අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9වසර සමත් වී තිබිය යුතුය.

(ii) වැඩ ක්ෂේත්‍ර කම්කරු (මාර්ග කම්කරු)
තනතුරු 19.

මාසික : රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 -
12 x 160 - රු. 17,600

(අ) අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුය.

8. සෞඛ්‍ය කම්කරු
තනතුරු 22.
මාසික : රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 -රු. 17,600

(අ) අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ.

02. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iv) අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

03. *බඳවා ගැනීමේ ක්‍රමය*.- ර.ප. චක්‍රලේඛ 24/95 විධි විධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

04 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත් දරු/වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසි වලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත් වල විධි විධාන වලට ද, මහරගම නගර සභාව විසින් වරින් වරට නිකුත් කරන ලද හා නිකුත් කරනු ලබන නියෝග වලට ද, අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.
(iv) බඳවා ගනු ලබන සේවකයින් අංක 7/2007 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2014.06.13 වැනි දින හෝ ඊට පෙර "ලේකම් මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහල කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කල යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය. ඉහත සඳහන් කොන්දේසි වලට අනුව නියමිත පරිදි ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
මහරගම නගර සභාව.

2014 මැයි මස 09 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම***

*මහරගම නගර සභාව*

**........................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :——————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————————.
03. ස්ථිර ලිපිනය:——————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
05. දුරකථන අංකය:——————————.
06. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
07. උපන් දිනය ඃ අවුරුද්ද :——————————.මාසය:——————————. දිනය:——————————.
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
10. විවාහක/අවිවාහක බව:——————————.
11. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග:——————————.
12. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුය.):——————————.

(1) අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————————.
සමත් වර්ෂය හා විභාග අංකය:——————————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු. අංකය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(ii) අවසන් වරට සමත් වූ ශ්‍රේණිය/වසර :——————————.

13. වෙනත් සුදුසුකම් :——————————.

14. සේවා පළපුරුද්ද :——————————.

13.1 දැනට සේවය කරන ආයතනය :——————————.

13.2 දැනට දරන තනතුර:——————————.

13.3 එම තනතුරට පත් වූ දිනය:——————————.

13.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන...................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.. .................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර ඔහු /ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————,
පදවි නාමය හා ආයතනය :——————————.

05-846

---

# පළාත් පාලන නිවේදන

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේනම් මෙම දැන්වීම පල කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එම්. උපාලි දිසානායක,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.


01. පාරේ නම : තිබ්බුටුමුණුව සිරිමල් මාවත
වසම : බුළුරුප්ප
දිග : අඩි 243
පළල : අඩි 8

*පාරේ වම් පස*

1. ඩබ්. ඇසලින් — කැබලි අංක 01
2. ඩබ්. විලියට් පෙරේරා — කැබලි අංක 08
3. සුනීතා වයලට් — කැබලි අංක 06

*පාරේ දකුණු පස*

1. කැබලි අංක 9 — ඩබ්. බේලින් පෙරේරා
2. කැබලි අංක 7 — සෝමා වික්‍රමනායක
3. කැබලි අංක 6 — සුනීතා වයලට්
4. කැබලි අංක 5 — ආතර් වීරසිංහ
5. කැබලි අංක 4 — ජී. සෝමාවතී
6. කැබලි අංක 3 — රමණී ප්‍රියන්ති සුහසිංහ



02. පාරේ නම : උඩුමුල්ල තුම්මුදුන මාර්ගය
වසම : 14C, කරඩුපන
දිග : අඩි 595
පළල : අඩි 8

*පාරේ වම් පස*

1. එම්. ආර්. චන්ද්‍රාවති මැණිකේ — හිටිනාවත්ත
2. එන්. ආරියවංශ — අලුත්ගේවත්ත
3. එම්. එම්. රත්නසිරි — බඩහැලහේන

*පාරේ දකුණු පස*


1. එම්. ආර්. චන්ද්‍රාවති මැණිකේ — හිටිනාවත්ත
2. ඩබ්. එම්. සුනන්ද — හිටිනාවත්ත
3. කේ. වී. හීන්බණ්ඩා — අලුත්ගේවත්ත
4. එම්. එම්. රත්නසිරි — බඩහැලහේන

උඩුමුල්ල තුම්මුදුන මාර්ගය

J.R. MAHINDA BANDARA JAYAKODY.
Licensed Surveyor & Leveller
Court commissioner & Valuer
"Mahinda " Molagoda
Main Road(A-1)
Kegalla
Reg.No: 199112431
035-5674680
077-6251025

PLAN NO: 12/695/C

(UDAMULLA THUMMUDUNA ROAD)




Scale 1:1000

PLAN

— of —

Five(5) allotments of land called "HITINA WATTA,BADAHELA HENA and ALUTHGE WATTA"
(UDAMULLA THUMUDUNA ROAD)
situated at PALLE KARADUPONA village in
Kinigoda korale in Deyaladahamunu pattu
(KEGALLA div. sec. Area)
(G.S.14/C-karadupona wasama)

| udamulla thumuduna Road |
| --- |
| Wide- 8ft |
| Length-170m |

Kegalla District
SABARAGAMUWA PROVINCE

සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

* Bounded as described above:

| LOT NO. | EXTENT | | | | Remarks |
| --- | --- | --- | --- | --- | --- |
| | Hecteres | A | R | P | |
| 1 | 0.0140 | 0 | 0 | 05.53 | Road (C.Menike) |
| 2 | 0.0147 | 0 | 0 | 05.81 | Road (W.M.Sunanda) |
| 3 | 0.0069 | 0 | 0 | 02.73 | Road (N.Ariyawansa) |
| 4 | 0.0089 | 0 | 0 | 03.52 | Road (K.V.Heenbada) |
| 5 | 0.0230 | 0 | 0 | 09.09 | Road (Rthnasiri) |
| Total | 0.0675 | 0 | 0 | 26.68 | |

Containing in extent : 0.0675Hectares(A-0,R-0,P-26.68)

surveyed & Partitioned on : 27/5/2013
Outer boundary Surveyed as pointed out by clients
ES/2006/1

2013/5/30

J.R.M. BANDARA JAYAKODY
Licensed Surveyor & Leveller
Licensed Surveyor & Leveller


03. පාරේ නම : බෙලිවත්ත පටුමග
වසම : උඟුරාඋල්ල
දිග : අඩි 850
පළල : අඩි 12

පාරේ වම් පස

| | | |
|---|---|---|
| 1. | සුසිලා මංගලිකා | බෙලිවත්ත හේන |
| 2. | එච්. ටී. යසවතී මැණිකේ | බෙලිවත්ත හේන |
| 3. | ඩී. ආර්. තරංගා කුමාරි | බෙලිවත්ත හේන |
| 4. | ඩබ්. ඒ. අග්‍රා ප්‍රියදර්ශනී | බෙලිවත්ත හේන |

පාරේ දකුණු පස


| | | |
|---|---|---|
| 1. | ආර්. ඒ. එස්. ආර්. ඩබ්. රණවීර | ගොඩපරගහමුලහේන |
| 2. | ඩී. ජී. එම්. පී. රාජසූරිය | ගොඩපරගහමුලහේන |
| 3. | ඒ. ජී. අයි. පී. ජයසිංහ | ගොඩපරගහමුලහේන |
| 4. | ඒ. එම්. කරුණාවතී | ගොඩපරගහමුලහේන |
| 5. | පී. වී. ජී. දිසානායක | ගොඩපරගහමුලහේන |
| 6. | සී. ඒ. සනත් බණ්ඩාරනායක | ගොඩපරගහමුලහේන |



04. පාරේ නම : කලුගල්ල පේරගස්තැන්න
වසම : කලුගල්ල
දිග : අඩි 877
පළල : අඩි 8

| පාරේ වම් පස | | | පාරේ දකුණු පස | | |
|---|---|---|---|---|---|
| 1. | ඊ. ආර්. ජයතිලක බංඩා | අම්බලන්ගොඩැල්ලහේන | 1. | එල්. ජී. ජයතිලක | පොල්කටුගොල්ලවත්ත |
| 2. | කේ. ජී. ලීලාවතී | පේරගස්තැන්නවත්ත | 2. | එම්. ජී. මුතුබණ්ඩා | මහවත්ත |
| 3. | ඩබ්. ඩී. දයාරත්න | පේරගස්තැන්නවත්ත | 3. | ඩබ්. ඩී. ප්‍රේමසිරි | පේරගස්තැන්නවත්ත |
| | | | 4. | ඒ. එම්. අත්තනායක | පේරගස්තැන්නවත්ත |
| | | | 5. | ඊ. ආර්. හීන්බණ්ඩා | පේරගස්තැන්නවත්ත |

4. කලුගල්ල පේරගස්තැන්න පාර




06. පාරේ නම : කවුඩුගම සමගි මාවත
වසම : කවුඩුගම
දිග : අඩි 590
පළල : අඩි 10

*පාරේ වම් පස*

1. කේ. ජී. ජේ. සී. බණ්ඩාර හිටිනාවත්ත
2. ටී. ජී. නිල්මිණි පද්මලතා හිටිනාවත්ත
3. කුමුදුනි වැලිපිටිය හිටිනාවත්ත
4. ඩිංගිරි බණ්ඩා හිටිනාවත්ත
5. කේ. එම්. ජේම්ස් හිටිනාවත්ත

*පාරේ දකුණු පස*

1. ජී. ආර්. තුසිත සමන් කුමාර හිටිනාවත්ත
2. කේ. ජී. ජේ. සී. බංඩාර හිටිනාවත්ත
3. එච්. ඩබ්. පියවතී හිටිනාවත්ත
4. ඊ. පෙරේරා හිටිනාවත්ත




පරිමාණය 1 : 1000

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පුරණකුරු කෝරළේ මාවත පත්තුවේ
කවුඩුගම ගමේ පිහිටි සමගි මාවත නම් මාර්ගය
දැනට පොළොවේ පිහිටි මායිම් අනුව මා විසින් මැන සාදන ලද
**පිඹුර**

| කැබලි අංකය | බිම ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | [illegible] | රූඩ් | පර්චස් |
| 1 | 0.0485 | 0 | 0 | 19.18 |
| එකතුව | 0.0485 | 0 | 0 | 19.18 |

බිම කැබැල්ලේ මායිම් ඉහත දැක්වෙන පිඹුරේ පරිදි වේ.


මැනීම කළේ : 2013 - 09 - 11 වන දින දීය

2013.09.12

2012.09.22


07. පාරේ නම : පුස්සැල්ල නාදිවලවත්ත මාර්ගය
වසම : පුස්සැල්ල
දිග : අඩි 644
පළල : අඩි 12

| පාරේ වම් පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. වයි. ජී. චන්ද්‍රාවතී | කටුගංගොල්ල වත්ත | 1. ඊ. ඒ. සමන්ත | කටුගංගොල්ල වත්ත |
| 2. ඊ. ඒ. සමන්ත | | 2. කේ. ආර්. තිලකාවතී | |
| 3. වී. ජී. සී. සෙනරත් | | 3. යූ. ජී. චමින්ද | |
| 4. ඊ. ඒ. පොඩිරාලහාමි | | 4. යූ. ජී. පියසේන | |
| 5. ඒ. ඩබ්. කරුණාවතී | | 5. ඒ. ඩබ්. කරුණාරත්න | |
| 6. එස්. නන්දාවතී | | 6. ඒ. ටී. පොඩිමැණිකේ | |
| 7. ඊ. ඒ. විජේරත්න | | 7. ඊ. ඒ. කුමාරසිංහ | |



08. පාරේ නම : පානකාව ලිහිණියාගොල්ල මාර්ගය
වසම : පරණගම්පළ
දිග : අඩි 298.5
පළල : අඩි 10


| පාරේ වම් පස | | | පාරේ දකුණු පස | | |
|---|---|---|---|---|---|
| 1. | එම්. එල්. එම්. වික්‍රමසිංහ | කැබලි අංක 02 | 1. | ජී. ඊ. එම්. වික්‍රමසිංහ | කැබලි අංක 01 |
| | | | 2. | පී. එන්. ඩී. සමරතුංග | කැබලි අංක 02 |
| | | | 3. | පී. පී. සී. පහලමුල්ලගේ | කැබලි අංක 03 |
| | | | 4. | ආර්. ඒ. ඩී. එන්. රාජපක්ෂ | කැබලි අංක 04 |
| | | | 5. | එන්. එම්. ජී. නිහල් ද සිල්වා | කැබලි අංක 05 |



| | | | |
|---|---|---|---|
| 09. | පාරේ නම | : | ඉත්තකොහේන වත්තේ සිට අන්නාසිගල දක්වා |
| | වසම | : | බෙලිහුල්වාන |
| | දිග | : | අඩි 330 |
| | පළල | : | අඩි 10 |

| පාරේ වම් පස | | | පාරේ දකුණු පස | | |
|---|---|---|---|---|---|
| 1. | කල්‍යාණි මැණිකේ | ඉත්තකොහේනවත්ත | 1. | කල්‍යාණි මැණිකේ | ඉත්තකොහේනවත්ත |
| 2. | සෙනෙවිරත්න බංඩාර | ඉත්තකොහේනවත්ත | 2. | සෙනෙවිරත්න බංඩාර | ඉත්තකොහේනවත්ත |
| 3. | එච්. ආර්. විමලාවතී මැණිකේ | ඉත්තකොහේනවත්ත | 3. | එච්. ආර්. විමලාවතී මැණිකේ | ඉත්තකොහේනවත්ත |

09.




10. පාරේ නම : හෙට්ටිමුල්ල විහාර මාවත පළමු පටුමග මාර්ගය
වසම : හෙට්ටිමුල්ල
දිග : අඩි 535
පළල : අඩි 8

| පාරේ වම් පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. ඩබ්. ඩබ්. සමන් චමින්ද ගුණරත්න | 98/19/8 | 1. ඩබ්. ඩබ්. සුනිල් ජයසිංහ | 98/19/9 |
| 2. එම්. ජී. එස්. පී. විජේසිරි | 98/19/7 | 2. ඩබ්. ඩබ්. සෝමරත්න | 98/19/3 |
| 3. එච්. සමන්ත චන්දන කුමාර | 98/19/6 | 3. ඩබ්. ඩබ්. වීරසිංහ | 98/19/4 |
| 4. ඩබ්. ඩබ්. සුනිල් වික්‍රමසිංහ | 98/19/5 | | |
| 5. ඩබ්. ඩබ්. රුවන් කපිල චමින්ද | 98/19/8 | | |

10' හෙට්ටිමුල්ල විහාර මාවත පළමු පටුමග.

D. Ratnayake
Licensed Surveyor & Leveller,
Kegalle
Regd. No. 19770836

**PLAN No: 5792**
Extract of Lot 10




**Scale 1:1000**

සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

## PLAN

of
an allotment of land called Metiwalehena
( Lot 10 in Plan No-98/19, Made by R.K.Nissanka, Licensed Surveyor )
Situated in the village of Hettimulla in
Mawata Pattu of Paranakuru Korale

## KEGALLE DISTRICT

## SABARAGAMUWA PROVINCE

| Lot No. | Extent Hec | A | R | P | REMARKS |
|---|---|---|---|---|---|
| (10) | 0.0327 | 00 | 00 | 13.2 | Garden, land called Metiwalehena Road ( Width 8 ft ) |

Entire Land Containing in Extent : 0.0355 - Hectares ( 00 Acres 00 Rood 22.25 Perches )

Bounded as follows;

North by :-
East by :- See above
South by :-
West by :-


boundaries were pointed out by owners of the land
28th September 2013

D. RATNAYAKE
Licensed Surveyor & Leveller

F2-B80444

02. පාරේ නම : අමරසේකර වත්ත මාර්ගය
වසම : 51ඒ රංවල
දිග : අඩි 433
පළල : අඩි 16

| පාරේ වම් පස | | | පාරේ දකුණු පස | | |
|---|---|---|---|---|---|
| 1. | කේ. ඩී. සරනේරිස් | ලොට් අංකය 5 | 1. | උපුල් කුමාර | ලොට් අංකය 2 |
| 2. | උපුල් කුමාර | ලොට් අංකය 6 | 2. | ඒ. පී. දිසානායක | ලොට් අංකය 3 |
| 3. | එම්. එස්. තිලකරත්න | ලොට් අංකය 7 | 3. | ඒ. ජී. ජයකොඩි | ලොට් අංකය 4 |
| 4. | එස්. පී. නානායක්කාර | ලොට් අංකය 8 | | | |
| 5. | බී. රංජිත් පරාක්‍රම | ලොට් අංකය 9 | | | |
| 6. | ආර්. ඒ. ජී. ජයකොඩි | ලොට් අංකය 10 | | | |
| 7. | එච්. පී. කුලරත්න | ලොට් අංකය 11 | | | |




12. පාරේ නම : හපුවිට උඩුගම කාල්වානාදෙනිය හරහා ගුරුගල දක්වා මාර්ගය
වසම : ගොඩිගමුව
දිග : අඩි 1120
පළල : අඩි 10

*පාරේ වම් පස*

| | | |
|---|---|---|
| 1. | මල්ලිකා පණ්ඩිතරත්න | කාල්වානාදෙනිය කුඹුර |
| 2. | යූ, ජී. එම්. කරුණාරත්න | ගුරුගලේහේන |
| 3. | සීලවතී මැණිකේ | ගුරුගලේහේන |
| 4. | චන්දන සුනිමල් කරුණාරත්න | මී ගහමුලහේන |
| 5. | චන්ද්‍රලතා මැණිකේ | මී ගහමුලහේන |
| 6. | පියතිලක බණ්ඩා | මී ගහමුලහේන |

*පාරේ දකුණු පස*

| | | |
|---|---|---|
| 1. | මල්ලිකා පණ්ඩිතරත්න | කාල්වානාදෙනිය කුඹුර |
| 2. | යූ, ජී. එම්. කරුණාරත්න | ගුරුගලේහේන |
| 3. | සීලවතී මැණිකේ | ගුරුගලේහේන |
| 4. | චන්දන සුනිමල් කරුණාරත්න | මී ගහමුලහේන |
| 5. | චන්ද්‍රලතා මැණිකේ | මී ගහමුලහේන |
| 6. | පියතිලක බණ්ඩා | මී ගහමුලහේන |




13. පාරේ නම : වැත්තෑවවෙල සිට ටැංකිය හරහා දීවෙල මාර්ගය
වසම : මිනුවන්ගමුව
දිග : අඩි 697
පළල : අඩි 8

*පාරේ වම් පස*

| | | |
|---|---|---|
| 1. | ඩබ්. සුනිල් | වැත්තෑව කුඹුර |
| 2. | ඩබ්. පියසේන | වැත්තෑව කුඹුර |
| 3. | ඩබ්. එන්. සී. පීරිස් | පරණවත්ත |
| 4. | ඩබ්. උපාලි වික්‍රමතුංග | පල්ලිදෙනිය හේන |
| 5. | ඩබ්. සුනිල් විජේරත්න | පල්ලිදෙනිය හේන |

*පාරේ දකුණු පස*

| | | |
|---|---|---|
| 1. | ඩබ්. චන්ද්‍රසිරි | වැත්තෑව කුඹුර |
| 2. | ඩබ්. සිසිලින් නෝනා | වැත්තෑව කුඹුර |




05-853

**පන්නල ප්‍රාදේශීය සභාව - පන්නල**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව, පන්නල ප්‍රාදේශීය සභාවේ යක්විල උප කාර්යාල බල ප්‍රදේශයට අයත්, "ලක්ෂ්මී ජනපදය දුංගල්පිටිය මාර්ගය" නමින් භාවිතා කරන ලද මාර්ගය "සෝමරත්න අධිකාරි මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා සහ ලක්ෂ්මී ජනපදය ඉඩම "අධිකාරි පුර" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2013.10.29 දින පැවැති මාසික මහා සභා රැස්වීමේ අංක 03/27 දරන යෝජනාව පරිදි වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "සෝමරත්න අධිකාරි මාවත" හා ඉහත සඳහන් ඉඩම "අධිකාරි පුර" යනුවෙන් 2014.01.20 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

එල්. එම්. එස්. කේ. රංජිත් ලංසකාර,
සභාපති,
පන්නල ප්‍රාදේශීය සභාව,
පන්නල.

2014 ක් වූ මාර්තු මස 20 වැනි දින,
පන්නල,
පන්නල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

05-776

---

# අතුරු ව්‍යවස්ථා

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්ති වලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2014 ක් වූ මැයි මස 03 වැනි දින.

**මහජන පුස්තකාල විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පුද්ගලයින්ගේ අධ්‍යාපනික සංවර්ධනය, කියවීමේ රුචිකත්වය දියුණු කිරීම, පුද්ගල විනය හා පෞරුෂ වර්ධනය කිරීම, විනෝදාත්මක හා නිර්මාණාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ වූ සම්පත් හා සේවා සැපයීම තුළින් මහජන පුස්තකාල සේවාව විධිමත් කර පාලනය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

02. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා පරිදි පහත සඳහන් අංශ කිහිපයකින් හෝ සියල්ලෙන් සමන්විත වන්නේය.

(i) බැහැර දෙන අංශය
(ii) විමර්ශණ අංශය
(iii) ළමා අංශය
(iv) වාර සඟරා හා පුවත්පත් අංශය
(v) අධ්‍යයන අංශය
(vi) ග්‍රන්ථ සංරක්ෂණ අංශය
(vii) ජංගම හා ශාඛා පුස්තකාල
(viii) වෙනත් තොරතුරු සේවා

03. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයෙකු සිටිය යුතු අතර එසේ පත් කරනු ලබන තැනැත්තා මහජන පුස්තකාලයේ සංවිධානය හා කළමණාකාරිත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට වගකිව යුතු වන්නේය.

04. මහජන පුස්තකාලයේ අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා (මෙහි මින් මතු පුස්තකාල කමිටුව යනුවෙන් සඳහන් කරනු ලබන) පුස්තකාල උපදේශක කමිටුවක් වෙත පැවරෙන්නේය.

මෙම කමිටුව ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව පත් කරනු ලැබේ. එය පහත සඳහන් තැනැත්තන් ගෙන් සමන්විත වනු ඇත.

* සභාවේ සභාපතිවරයා
* ප්‍රාදේශීය සභාවේ සභිකයින් අතරින් තෝරා ගනු ලබන තුන්දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවක්
* සභා බල ප්‍රදේශයේ පදිංචි ජනතාව අදහන ආගම් නියෝජනය වන ආකාරයටම එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බැගින්
* ප්‍රාදේශීය සභාව විසින් තෝරා පත්කර ගනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි විශිෂ්ඨ තැනැත්තන් තුන්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්
* ප්‍රාදේශීය සභාවේ ලේකම්
* සභාවේ ප්‍රජා සම්බන්ධතා නිලධාරි
* ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපති
* බල ප්‍රදේශයේ විදුහල්පතිවරයෙක්
* බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩලයක නියෝජිතයෙක්

(ii) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නිල බලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, කමිටුවේ සෑම රැස්වීමකට ඔහු මූලාසනය දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයින් විසින් කමිටුවේ සාමාජිකයින් අතුරින් තෝරා පත් කර ගන්නා සාමාජිකයෙකු ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතුය.
(iii) ප්‍රාදේශීය සභාවේ ලේකම් කමිටුවේ කැඳවුම්කරු විය යුතුය.
(iv) ප්‍රාදේශීය සභා ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා කමිටුවේ ලේකම් විය යුතුය.
(v) ඝන පූරණය සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් විය යුතුය.
(vi) කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක්ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරක ඡන්දයක්ද ඇත්තේය.

05. *සාමාජිකත්වය ලබාගැනීම*

(i) පුස්තකාල සේවාවන් අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුම සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන ගාස්තුවක් ගෙවා පුස්තකාලයාධිපති වෙතින් ලබා ගන්නා අයදුම්පතක් මගින් සාමාජිකත්වය ඉල්ලුම් කල යුතු අතර එම අයදුම්පත පහත සඳහන් තැනැත්තෙකු ලවා සහතික කරවා ගත යුතුය.

* පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි
* සාමදාන විනිශ්චයකාරවරයෙක්
* ප්‍රාදේශීය සභාවේ සභිකයෙක්
* රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙක්
* පාසල් අයදුම්කරුවෙකු නම් එම අයදුම්කරුගේ පන්තිභාර ගුරුවරයා/විදුහල්පතිවරයාගේ සහතිකය

(ii) පුස්තකාල සාමාජිකත්වය ලැබීම සඳහා පහත සුදුසුකම් තිබිය යුතුය.

* සාමාන්‍ය සාමාජිකත්වය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචිකරුවෙකු හෝ දේපල හිමියෙකු හෝ ස්ථිර රැකියාවක් කරන්නෙකු වීම.
* පාසල් සාමාජිකත්වය සඳහා වයස අවුරුදු 5 ට වැඩි බල ප්‍රදේශයේ පාසලක හෝ පිරිවෙනක ඉගෙනුම ලබන්නෙකු විය යුතුය.

(iii) සාමාජික ගාස්තු

වාර්ෂික සාමාජික ගාස්තුව සාමාන්‍ය සාමාජිකයෙකු සඳහා රු. 100 කි. වසරකට වරක් රු. 30ක් ගෙවා අලුත් කරවා ගත යුතුය. පාසල් සාමාජිකයින් සඳහා සාමාජික ගාස්තු රු. 50.00ක් හා වසරකට රු. 15.00 ක් ගෙවා අලුත් කරවා ගත යුතුය. එසේ වුවද සාමාජික ගාස්තුව කමිටුවේ නිර්දේශය පරිදි සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලැබිය හැකිය. එසේම බැහැර දෙන අංශයට හැර විමර්ශන අංශය සහ අනෙකුත් අංශ පරිහරණය කිරීම සඳහා කමිටුවේ නිර්දේශය මත පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් පුස්තකාලයේ සාමාජිකයින් නොවන අයගෙන් අයකළ හැකිය.

(iv) ඇපකරුවන්

පාසල් සාමාජිකයින් සඳහා ඇපකරුවන් වශයෙන් ඔවුන්ගේ මව/පියා/භාරකරු/විදුහල්පති/පන්තිභාර ගුරුවරයා විය යුතු ය.

සාමාජිකයින් සඳහා ඇපකරුවන් වශයෙන් වාර්ෂික වැටුප් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියෙකු හෝ ප්‍රදේශයේ ප්‍රභුවරයෙකු/පවුලේ වෙනත් සාමාජිකයෙක්/ බදු ගෙවන්නෙක් අත්සන් කළ යුතුය.

06. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට නිකුත් කරන ලද බලපත්‍රයෙන් එක් වරකට පොත් 2 ක් ලබා ගත හැකි අතර සාමාජිකයා විසින් රැගෙන යන සෑම පොතක් සඳහාම ඔහු වගකිව යුතුය.

07. පුස්තකාල සාමාජිකයෙකු විසින් බැහැර ගෙන යන ලද පොතක් එය ලබා දින 14 ක කාලයක් ඇතුලත පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දිය යුතුය.

08. අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ සඳහන් දින 14 ක කාල සීමාව ඇතුලත යම් පොතක් පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ පොත ආපසු භාර දිය යුතු දිනය ඉක්මවා යන එක් දිනයක් වෙනුවෙන් රු. 2 බැගින් හා පාසැල් සාමාජිකයින් සඳහා රු. 1.00 බැගින් වන දඩ මුදලක් හෝ කමිටුවේ නිර්දේශ මත සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන යම් මුදලක් දඩ වශයෙන් ගෙවීමට යටත් වන්නේය.

09. බැහැර ගෙන යන ලද පොතක් දින 14 ක කාල සීමාව ඉකුත් වීමෙන් පසුව දින 30 ඇතුලත ආපසු භාර දීම සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ පොත නැති වූවා සේ සලකනු ලැබේ.

10. එසේ පොතක් නැති වූයේ යැයි සැලකෙන අවස්ථාවක එම පොතේ වටිනාකම සහ එම පොතේ වටිනාකමින් 25% ක් දක්වා දෙපාර්තමේන්තු ගාස්තුවක්ද අතුරු ව්‍යවස්ථාවේ 8 ඡේදයේ සඳහන් දඩ මුදල්ද අදාල සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

11. සාමාජිකයෙකු විසින් බැහැර ගෙන යන ලද පොතකට හානි කිරීම හෝ කවර ආකාරයකින් එය විරූප කිරීම හෝ නොකළ යුතුය.

12. බැහැර ගෙන යාමට අපේක්ෂා කරන පොතකට සිදු වී ඇති හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපති වරයාට දැනුම් දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකම වන්නේය. එවැනි හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක එය පොත සාමාජිකයාට හානියකින් හෝ විරූප කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතුය.

13. සාමාජිකයෙකු විසින් ආපසු භාර දෙන ලද පොතක් නැවතත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඔහු විසින් හානිකර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත් අවස්ථාවක එම පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව හානි වූ පොත "හානි වූ පොතක් ලෙස විකුණන ලදී" යනුවෙන් මුද්‍රාව තබා එම සාමාජිකයාට දෙනු ලැබිය යුතුය.

14. (i) පුස්තකාලයෙන් ලබා ගත් පොතක් කිසිම සාමාජිකයෙකු විසින් අන්සතු කිරීමක් නොකළ යුතුය.
(ii) ඉහත 13(1) අනු වගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

15. ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කල බව තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් ආපසු භාර නොදිය යුතුය.

බැහැර ගෙන යන ලද පොතක් ආසාදක ස්පර්ශක රෝගයකින් පෙලෙන තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විට ඒ පොත විනාශ කළ යුතු අතර එය නැවත සපයා ගැනීමේ වියදම ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිවරයාට ගෙවිය යුතුය.

16. කිසියම් පොතක් ලබා දිය යුත්තේ කවර සාමාජිකයාටද යන්න පිළිබඳව මත භේදයක් සාමාජකයින් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර උද්ගත වූ විටක එම මතභේදය පුස්තකාලයාධිපති විසින් විසඳිය යුතු ය.

17. බැහැර දෙන පොතක් කිසියම් සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටි විටක එය නිකුත් කල යුතු අතර ඒ වන විටත් එකී පොත නිකුත් කර තිබුනේ නම් ඉල්ලුම්කරුගේ හෝ ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයක සටහන් කරගෙන එම පොත පුස්තකාලයට ලැබුණු පසු ඒ ඒ තැනැත්තාට ලබා දීමට පුස්තකාලයාධිපතිවරයා ක්‍රියා කළ යුතු ය.

18. බැහැර දෙන පුස්තකාලය ඉරිදා දින ප්‍රසිද්ධ නිවාඩු දින හා යටත් පිරිසෙයින් සාමාජිකයින්ට දින 07 ක දැනුම් දීමකින් පසු තොග ගණන් ගැනීමෙන් පසු තොග ගණන් ගැනීම සඳහා කමිටුව විසින් නියම කරන යම් දිනයන්හි හැර දිනපතා පෙ.ව. 8.30 සහ ප.ව. 4.30 අතර කාලය තුල විවෘතව තබනු ලැබේ. නමුත් සභාවේ අභිමතය පරිදි පුස්තකාලය විවෘතව තබන වේලාවන් හා දිනයන් වෙනස් කරනු ලැබිය හැක.

19. විමර්ෂණ අංශය

* පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ඇතිව විමර්ෂණ අංශයේ තබා ඇති ලේඛනයේ අත්සන් තබා විමර්ෂණ ග්‍රන්ථ පරිශීලනය කළ යුතුය.

* කියවීම සඳහා තමන් වෙත නිකුත් කරන ලද කිසිම පුස්තකාල පොතක් සඟරාවක් හෝ වෙන යම් දෙයක් විමර්ෂණ අංශයෙන් පිටත ගෙන නොයා යුතුය. එසේ වුවද ඡායා පිටපත් සේවාවක් ක්‍රියාත්මක වන්නේ නම් පුස්තකාලයාධිපතිවරයාගේ අනුමැතිය හා භාරකාරීත්වය යටතේ එම ප්‍රකාශනයේ අවශ්‍ය පිටු නියමිත ගාස්තු ගෙවා ඡායා පිටපත් කර ඉල්ලා සිටින යම් තැනැත්තෙකුට ඉඩකඩ සැලැස්විය යුතු ය.

20. කියවීම් ශාලාව

* සතියේ සෑම දිනකම පුස්තකාලයේ කියවීම් ශාලාව පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා හෝ සභාව විසින් තීරණය කරනු ලබන දිනයන් හා වේලාවන් තුල විවෘත කර තබනු ලැබේ. කියවීම් ශාලාව පරිහරණය කිරීමට ඕනෑම තැනැත්තෙකුට හැකි අතර ඒ සඳහා කියවීම් ශාලාවේ තබා ඇති ලේඛනයේ නම හා පැමිණි වේලාව සටහන් කර අත්සන් තබා කියවීම් ශාලාවේ සේවාවන් ප්‍රයෝජනයට ගත යුතු ය.

* කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයත් කිසිම පුවත් පතක්, වාර ප්‍රකාශනයක්, සඟරාවක්, සිතියමක් හෝ වෙනත් පුස්තකාල ද්‍රව්‍යයකට හානියක් නොකළ යුතු අතර බැහැර ගෙන යාමද නොකළ යුතු ය.

21. කිසියම් තැනැත්තෙකු

* මහජන පුස්තකාල පරිශ්‍රය තුළ හෝ අවට නොහික්මුණු ආකාරයේ හැසිරීම් හෝ හිරිහැරයක් ඇති කිරීම නොකල යුතුය.
* පුස්තකාලයේ හෝ ඒ අවට ප්‍රාදේශීය සභාවේ යම් ගොඩනැගිල්ලක කොටසකට හෝ යම් දේපලකට අලාභයක් කිරීම හෝ යම් ආකාරයකින් ඒවා විරූපි කිරීම හෝ නොකල යුතුය.
* පුස්තකාලයේ වේලාවෙන් පසු එකී පුස්තකාල පරිශ්‍රය තුල මත්පැන් පානය, දුම් බීම හෝ කෙළ ගැසීම නොකළ යුතුය.
* පුස්තකාල පරිශ්‍රය තුල දාදු කැට වලින් හෝ කාඩ් කුට්ටම් වලින් සූදුවෙහි නොයෙදිය යුතුය.
* පුස්තකාල පරිශ්‍රය තුල ඇතුලත ඝෝෂා කිරිමෙන්, ගී ගැයීමෙන්, වෙනත් ශබ්ද නැගීමෙන් හෝ ජංගම දුරකථන භාවිතයෙන් එම පුස්තකාලය පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.
* අපිරිසිදු තත්ත්වයකින් මහජන පුස්තකාලය පරිශ්‍රයට ඇතුළු නොවිය යුතු ය.
* පුස්තකාල පරිශ්‍රය තුල නිදා ගැනීම හෝ යම් ආහාරයක් ගැනීම නොකළ යුතු ය.
* පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලයාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තෙකුට මේ ව්‍යවස්ථාව යටතේ ඔහුගේ බලතල නිත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමෙහි ලා බාධා නොකළ යුතුය.

22. යම් ආසාධන ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙලෙන හෝ මෑතකදී පෙලුණු නැතහොත් ඒ රෝගයකින් පෙලෙන තැනැත්තෙකුට මෑතකදී උපස්ථානයේ යෙදුණු කිසියම් අයෙකු රෝග බෝවීමේ කාලය ඉකුත් වන තෙක් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩකිරීමක්ම වරදක් වන අතර, කිසියම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියෙන් නියම කර ඇති දඩයකටද, එම කඩ කිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම් වරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුවද ඒ වරද කරගෙන යන්නේ නම් සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතු ය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා සභාපති යන්නෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද, ලේකම් යන්නෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාද, පුස්තකාලයාධිපති යන්නෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පුස්තකාල සේවාවට අයත් ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය භාරව කටයුතු කරන ප්‍රධාන නිලධාරියා හෝ එම තනතුරේ කටයුතු කිරීම සඳහා යොදවා ඇති වෙනත් ඕනෑම නිලධාරියෙකුද අදහස් වේ.

පුස්තකාල ද්‍රව්‍ය යන්නෙන් :- ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය අදහස් කෙරේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් ව්‍යවස්ථාවක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇතිවුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකදීම බලාත්මක විය යුතු ය.

05-777

---

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්ති වලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2014 මැයි මස 03 වැනි දින.

**ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නවතා තැබීමට ස්ථාන ඇති කිරීමට සහ වාහන නවතා තැබීම පාලනය කිරීම හා ඒ පිළිබඳව ගාස්තු අය කිරීම පිළිබඳව පනවනු ලැබේ.

03. මෙහි මින් මතු සභාපතිවරයා වශයෙන් හඳුන්වනු ලබන පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බල ප්‍රදේශය ඇතුලත වාහන නතර කර තැබීම හෝ නතරකර තැබීම තහනම් කරන හෝ සීමා කරන නැතහොත් පාලනය කරන යම් වීදියක, විදියක කොටසක වාහන සඳහා වෙන් කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානයක් සඳහන් කර දැන්වීමක් ඒ වීදියෙහි නැතහොත් වීදියෙහි කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනී යන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

04. 03 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කිරීම හෝ නතර කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක වාහනයක රියැදුරු විසින් -

*(අ)* කිසියම් නිලධාරියෙකු හෝ බලධාරියෙකු විසින් ඒ වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි ඉදිකරනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති කිසියම් මාර්ග සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියාකිරීමේ ; *හෝ*

*(ආ)* ඒ වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනාගමනයක පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීමේ *හෝ*

*(ඇ)* එම වාහනයට බඩු පැටවීමේ හෝ ඒ වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනය වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි නතර කර තැබීමට සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවීමෙන් පසු සභාපතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්නම් මිස කිසියම් තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ 03 වන උපලේඛනයේ මෝටර් වාහන නවතා තැබීම සඳහා වෙන් කර ඇති ස්ථානයක වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

06. මෙම අතුරු ව්‍යවස්ථාවේ තුන්වන උපලේඛනය මගින් දන්වා ඇති මෝටර් වාහන නතර කර තැබීමේ ස්ථාන වරින් වර සභාව මගින් සංශෝධනය කර ගැසට් පත්‍රයේ පලකිරීමට බලය ඇත. 05 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය සඳහා සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කොට ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් කලින් කල සංශෝධනය කිරීමට යටත්ව මෙහි අංක 1 උප ලේඛනයෙහි දක්වා ඇති පරිදි ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.

07. රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් හෝ සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ සභාව විසින් කලින් කලට නියම කරනු ලබන මාසික ගාස්තු සභාව වෙත ගෙවනු ලැබීමෙන් අවස්ථාවෝචිත පරිදි ඒ දෙපාර්තමේන්තුවට හෝ පුද්ගල මණ්ඩලයට හෝ අයත් මෝටර් වාහන සඳහා මාසික හෝ වාර්ෂික අවසර පත්‍රයක් ලබාගත හැකි ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම එය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් වෙනුවෙන් ද එම මෝටර් වාහනය හැඳින්වීමේ අංකය සඳහන් විය යුතු අතර එය අවසර පත්‍රයෙහි සඳහන් කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

09. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙකු විසින් ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පෙනෙන පරිදි වාහනය තුල ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

10. පොලිස් නිලධාරියෙකු හෝ රථවාහන පාලකයෙකු විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතරකර ඇති යම් මෝටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති අවසරපත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුවද ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියදුරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

11. කිසියම් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක, කිසියම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබූ අවස්ථාවක කිසියම් තැනැත්තෙකු විසින් එම පන්තියට හෝ වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එහි නතර කර තැබීම කරනු නොලැබිය යුතු ය.

12. වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළුවන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධාවන ආකාරයට කිසිම තැනැත්තෙකු විසින් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කරනු නොලැබිය යුතු ය.

13. වාහන නතරකර තැබීම සඳහා වෙන් කර ඇති පොදු ස්ථානයක ඇතුළුවීම හා පිටවීම සඳහා වෙනම මාර්ග සලසා ඒ බව දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් දක්වා ඇති අවස්ථාවක නියමිත අදාල මාර්ගයෙන් හැර කිසිම මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුළුවීම හෝ පිටවීම නොකළ යුතු ය.

14. දම්වැල් හෝ කුළුණු හෝ දම්වැල් සහ කුළුණු යන දෙවර්ගයම සපයා ඇති පොදු නැවතුම්පලක නතර කරනු ලබන මෝටර් වාහන සියල්ලම ඒවා පැමිණි අනුපිළිවෙල අනුව එකිනෙක පිටුපසින් එකම පැත්තට මුහුණලා නතරකර තැබිය යුතු අතර ඉදිරියේ හිස්තැන් ඇති වන අනුපිළිවෙලට අනුක්‍රමිකව එම වාහන ඉදිරියට ගෙනයා යුතු ය.

15. මෝටර් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කර තිබිය දී කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකළ යුතු ය.

16. කිසිම තැනැත්තෙකු විසින් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයකින් වාහන ඉවත්කර ගැනීමේ කාර්ය සඳහා අළුත්වැඩියාවක් කිරීමක් අත්‍යාවශ්‍ය වන්නේ නම් මිස වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතරකර තබා ඇති මෝටර් වාහනයක කිසියම් ආකාරයක අළුත්වැඩියාවක් කරනු නොලැබිය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව එක් එක් දිනයෙහි පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා කාලය සඳහා ක්‍රියාත්මක විය යුතුය. මෙම කාල වේලාවන් සභාපතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නිවේදනයක් මගින් සංශෝධනය කල හැකි වන්නේ ය.

18. සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ නියමයක් මගින් කිසියම් නිශ්චිත පුද්ගල පන්තියක් නිශ්චිත ගාස්තු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩකරන යම් තැනැත්තෙකු වරදක් කරන අතර එම තැනැත්තා නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් දඩයකට යටත්වන අතර එම වරද දිගින් දිගටම තවදුරටත් කරගෙන යන විටක එසේ කරනු ලබන සෑම දිනකටම ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියෙන් නියම කර ඇති අතිරේක දණ්ඩනයකට යටත් වන්නේ ය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල“සභාපතිවරයා” යන්නෙන් පැලමඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.

21. "පොලිස් නිලධාරියා" යන්නෙන් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරියෙකු අදහස් වේ.

22. "රථ වාහන පාලක" යන්නෙන් පොදු නතර කිරීමේ ස්ථානයක මෝටර් වාහන නතරකර තැබීම සඳහා සභාපතිවරයා වෙනුවෙන් අවසරපත්‍ර නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයෙකු අදහස් වේ.

23. වෙනත් විශේෂ කාර්යයක් සඳහා නිත්‍ය කුලී රථ නතර කර ඇති ස්ථාන භාවිතයට ගැනීම හෝ සභාපතිවරයා විසින් දෙනු ලබන විශේෂ අවසර පත්‍රයක් මත විශේෂ අවස්ථාවන් වලදී එම ස්ථානවල වෙනත් කාර්යයන් සඳහා මෝටර් වාහන නවතා තැබීම නිත්‍යානුකූල වන්නේ ය.

24.නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කර වාර්ෂික අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම අයදුම්කරුවෙකුම අදාළ වර්ෂයේ පළමු මාසය ගත වීමට පෙර දෙවන උපලේඛනයේ දැක්වෙන නියමිත ගාස්තු ගෙවා අවසර පත්‍රය අලුත් කර ගත යුතු ය.

*අංක 01 උපලේඛනය*

| | | *පළමු වැනි පැය හෝ ඉන් කොටසක් සඳහා ගාස්තු* | *පළමු වැනි පැයට වැඩි පැය 4ක් නොඉක්මවන සෑම අතිරේක පැයකටම හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව* | *පැය 4ක් ඉක්මවන්නා වූ සෑම පැයක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| (අ) | මෝටර් සයිකලයක් සඳහා | නැත | නැත | නැත |
| (ආ) | මෝටර් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | 20 0 | 10 0 | 10 0 |
| (ඇ) | ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් හෝ ලොරියක් සඳහා | 30 0 | 10 0 | 10 0 |
| (ඈ) | ට්‍රේලරයක් රහිත ට්‍රැක්ටරයක් | 20 0 | 10 0 | 10 0 |
| (ඉ) | බස් රථයක් සඳහා | 30 0 | 10 0 | 10 0 |

*අංක 02 උපලේඛනය*

| | | | මසකට *රු. ශ.* |
|---|---|---|---|
| (අ) | ත්‍රීරෝද රථයක් සඳහා මසකට | | 150 0 |
| (ආ) | කාර් රථයක් හෝ වෑන් රථයක් සඳහා මසකට - | | |
| | (i) | ඩීසල් පාවිච්චි කරන වාහනයක් නම් | 200 0 |
| | (ii) | පෙට්‍රල් ගෑස් පාවිච්චි කරන වාහනයක් නම් | 200 0 |
| | (iii) | කුඩා ලොරියක් සඳහා මාසිකව | 250 0 |
| (ඇ) | ට්‍රේලරයක් සහිත හෝ රහිත ට්‍රැක්ටරයක් සඳහා මසකට | | 200 0 |
| (ඈ) | බස් රථයක් සඳහා මසකට | | 250 0 |

*අංක 03 උපලේඛනය*

*වාහන නතර කර තැබීමේ ස්ථාන*

01. පැල්මඩුල්ල බස් නැවතුම් පොල ඉදිරිපිට
02. පැල්මඩුල්ල සෙලාන් බැංකුව ඉදිරිපිට
03. පැල්මඩුල්ල බලංගොඩ පාර බෝගහ අසළ
04. පැල්මඩුල්ල රක්වාන පාර බෝගහ අසල
05. පැල්මඩුල්ල සමූපකාර මන්දිරය ඉදිරිපිට
06. කුට්ටාපිටිය විද්‍යාල මාවත අසල
07. පැල්මඩුල්ල සමූපකාර ඉන්ධන පිරවුම් හල ඉදිරිපිට
08. පැල්මඩුල්ල මාලිංග එන්ටප්‍රයිසස් අසල
09. පැල්මඩුල්ල බටලන්ද කන්ද මුදුන
10. වැලිහිඳ හංදිය
11. පනාවැන්න හංදිය
12. කෙටේතැන්න පොලීසියට හැරෙන හංදිය හා කෝවිල හංදිය
13. කහවත්ත වැව්ලි සමාගමට යන මාර්ගය අසල
14. කහවත්ත තරුණ වෙළඳපල අසල (කට්ටංගේ පාර අසල)
15. පොරෝණුව පාර අසල
16. බත්ගම්ගොඩ හංදිය අසල
17. මීගහගොඩ හංදිය
18. බොරාල හංදිය
19. නීලගම හංදිය
20. ගනේගම හංදිය
21. මීදිගහමුල්ල හංදිය
22. පාතකඩ හංදිය
23. කිරිවැල්දෙනිය හංදිය
24. සන්නස්ගම පාළුගම්පොල හංදිය
25. ගල්ලින්න හංදිය
26. ලෙල්ලෝපිටිය හංදිය
27. ලෙල්ලෝපිටිය කන්ද මුදුන (රාහුල විද්‍යාලය ඉදිරිපිට)
28. ගෝණකුඹුර හංදිය
29. මාරපන මඩහංදිය
30. මාරපන උපකාර්යාලය අසල
31. බුළුගහතැන්න විද්‍යාලය අසල
32. පනගම හංදිය
33. හපුරුගල හංදිය
34. අලුපොත හංදිය
35. ඉහල හකමුව කඩමණ්ඩිය අසල
36. බැරැණ්ඩුව කඩමණ්ඩිය අසල

05-778

---

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

ආදාහනාගාරයක් පවත්වාගෙන යාම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2008.07.18 දින පල කරන ලද iv (අ) කොටස *ගැසට් පත්‍රයේ* ආදාහනාගාරය පවත්වාගෙන යාම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ 1352 පිටුවේ සඳහන් 03 වන වගන්තියේ අංක 01 උප වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

01. මරණය ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද මරණ සහතිකය හෝ උප්පැන්න, මරණ, විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41(1)(අ) වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇති B16 ආකෘති පත්‍රයට අනුව නිකුත් කරන ලද මරණ දැන්වීමේ සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

කීර්තිසිරි විජේතුංග,
සභාපති.

2014 මැයි මස 12 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-854

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.